# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2013

## පෙරදිග සංගීතය

## 7 ශ්‍රේණිය

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

කාලය - පැය 2 යි

නම : .......................................................................... පන්තිය : ........................

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1-15 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. පෙරදිග හා අපරදිග සංගීතයේදී යොදා ගන්නා සම්පූර්ණ ස්වර ගණන වනුයේ,
   i. පහකි  ii. හතකි  iii. දහයකි  iv. දොළහකි

2. සප්තකයේ ඇති අචල ස්වර වනුයේ,
   i. ස, ග  ii. රි ග ම ධ නි  iii. ස, ප  iv. රි ග ධ නි

3. අපරදිග සංගීතයේ Flat, Sharp යන්න පෙරදිග සංගීතයේ හඳුන්වන්නේ පිළිවෙළින්,
   i. ශුද්ධ, තිව්‍ර  ii. කෝමළ, තිව්‍ර
   iii. ශුද්ධ, කෝමළ  iv. තිව්‍ර, කෝමළ

4. ශුද්ධ ස්වර සඳහා භාවිත කරන වෙනත් නාමයක් වනුයේ,
   i. ප්‍රකෘති ස්වර  ii. Flat note
   iii. අචල ස්වර  iv. විකෘති ස්වර

5. දරුවන් නැළවීම සඳහා යොදා ගන්නා ගීත විශේෂය හඳුන්වනුයේ,
   i. මැසිවිලි ගී  ii. නැළවිලි ගී  iii. ළදරු ගී  iv. ළමා ගී

6. බටහිර සංගීතයේ හඬතල අතරින් වයලීනය නම් භාණ්ඩයට අදාළ හඬතලය වනුයේ,
   i. ටෙනර්  ii. සොප්රානෝ  iii. ඇල්ටෝ  iv. බේස්

7. $D^b$ $E^b$ $A^b$ $B^b$ යන ස්වර වෙනත් ආකාරයකට දැක් වූ විට,
   i. $C^\#$ $A^\#$ $G^\#$ $D^\#$  ii. $C^\#$ $D^\#$ $G^\#$ $A^\#$
   iii. $D^\#$ $C^\#$ $F^\#$ $G^\#$  iv. $D^b$ $E^b$ $F^\#$ $B^b$

8. පෙරදිග සංගීතයේ යොදා ගන්නා සප්තක අනුපිළිවෙළින් දැක්වූ විට,

i. මධ්‍ය, මන්ද්‍ර, උච්ච ii. උච්ච, මධ්‍ය, මන්ද්‍ර

iii. මන්ද්‍ර, උච්ච, මධ්‍ය iv. මන්ද්‍ර, මධ්‍ය, උච්ච

9. මධ්‍ය "ස" ස්වරයේ සංඛ්‍යාතය වනුයේ,

i. 563 ii. 265 iii. 256 iv. 128

10. "සරිග, සරිගම" යන ස්වර අභ්‍යාසයේ මීළඟ ස්වර ඛණ්ඩය වනුයේ,

i. රිගම, රිගමප ii. ගමපධ, මපගම

iii. රිගමප,රිමගම iv. සගරිම,සරිගම

- පහත සඳහන් ස්වර ප්‍රස්තාර ආශ්‍රයෙන් 10-13 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. + නිනි ස | රි ග ග| ස රිස රිග |රි ස -

B. ස ම ම ම | ම - - - |ම ධ ප ම |ග - මග රි|

C. ස - රි |ග ම - | ස රි ග |ම ප - |

ස රි ග |ම ප ධ | නි - - |- - -|

D. ස ස ග ග| රි රි ග - |ස ස රි රි|ග - - -|

E. ස ස රි රි|ග රි ස - |රි රි ම ම |ප - - -|

11. තුන් සරණේ ගීතයට අදාළ ස්වර ප්‍රස්තාරය ඇත්තේ කුමන කොටසේද?

i. B ii. A iii. D iv. C

12. B කොටසේ ස්වර අයත් වන්නේ කුමන ගී වර්ගයට ද?

i. ස්වර ස්ථාපන ගී ii. ඔන්චිලි වාරම iii. නැළවිලි ගී iv. කෝළම් ගී

13. ශුද්ධ ස්වර ස්ථාපන ගීත ස්වර ප්‍රස්තාර ඇතුළත් කොටස් මොනවා ද?

i. ABD ii. CD iii. C D iv . CED

14. "කරුණාව සමහ හොඳ හිත" යන ගීතය ගායනා කරන්නේ කවුද?

i. සුනිල් එදිරිසිංහ iii. චන්ද්‍රා කබ්රාල්

iii. ඩබ්. ඩී. අමරදේව iv. කෝකිල දේවි

15. "පුංචි බතල ගැට තුඹ කොළ" යන රබන් පදය වැයෙන්නේ,

i. මාත්‍රා දෙකෙන් දෙකටය ii. මාත්‍රා තුනෙන් තුනටය

iii. මාත්‍රා හතරෙන් හතරටය iv. මාත්‍රා තුනෙන් හා හතරෙන්ය

- 16 -20 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.

වයලින් පවුලේ භාණ්ඩ වශයෙන් 16). .................................... .......................................... යන භාණ්ඩ දැක්විය හැකිය.මෙයින් වයලීනය නැමති භාණ්ඩය 17). ........................................ ලෙස අපරදිග ක්‍රමයට තත් සුසර කරයි. වයලීන් පවුලේ භාණ්ඩ මෙන්ම සිතාරයද පෙරදිග සංගීතයේ වැදගත්කමක් උසුලයි. සිතාරය වාදනය සඳහා 18). ................................................ යොදාගනී. මෙහි ප්‍රධාන තත් 19)............................. පමණ තිබේ. මෙහි නිර්මාතෘ ලෙස 20)............................................ හැඳින්විය හැකිය.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුලු ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේම ලියන්න.

1)

I. විකෘත් ස්වර නම් කරන්න.

II. $F^{\#}$ යන ස්වරය වෙනත් ආකාරයකින් දක්වන්න.

III. කෝමළ සහ තිවුර ස්වර එක් නමකින් හඳුන්වන්න.

IV. ලයෙහි ප්‍රභේද නම් කරන්න.

V. එදිනෙදා කරන තාලානුකූල ක්‍රියාවන් 02 ක් ලියන්න.

VI. මාත්‍රා යනු කුමක්ද?

VII. මාත්‍රා තුනෙන් තුනට ගමන් කරන ගීත දෙකක මුල්පේළිය බැගින් ලියන්න.

VIII. "සංධ්වනියක්" (Symphony) යන්න හඳුන්වන්න.

IX. වයලින් පවුලට අයත් පෙරදිග හා අපරදිග සංගීතයේ දී භාවිත වන භාණ්ඩය කුමක්ද?


X. කර්ණාටක සංගීතයට අනුව වයලීනයේ තත් සුසර කරන ආකාරය ලියන්න.

XI. බටනලා වර්ග දෙක නම් කරන්න.

XII. ලෝක ප්‍රසිද්ධ සිතාර් වාදකයකු නම් කරන්න.

(ලකුණු 2x12 = 24)

2) පහත සඳහන් රූප සටහන ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.




I. වයලීනය පෙරදිග ක්‍රමයට තත් සුසර කරන ආකාර තුන ලියන්න. (ලකුණු 02)

II. ඉහත රූප සටහනෙහි අංක 1 – 14 දක්වා ලකුණු කර ඇති කොටස් වලින් ඔබ කැමති කොටස් 10ක් පමණක් නම් කරන්න. (ලකුණු 1 x 10 = 10)